# හිත හොඳ පූස් රාළ



වෙනුති නෙලින්යා.

# හිත හොඳ පූස් රාළ

කර්තෘ : වෙනුති නෙලින්යා.

**ISBN : 978-624-208-311-7**

**කර්තෘ ප්‍රකාශනයකි.**

**සියලුම හිමිකම් කර්තෘ සතුය.**

**කර්තෘගේ වෙනත් කෘති : හා පැංචිගේ මැණික**

ප්‍රථම මුද්‍රණය

2025 පෙබරවාරි 08

**කතාව හා චිත්‍ර**

වෙනුති නෙලින්යා.

3 ශ්‍රේණිය **D**

මහ/මහාමායා බාලිකා විදුහල
මහනුවර.

# පිදුම

**මගේ ආදරණීය**

**මහාමායා මෑණියන් ට**

**සෙනෙහසින්.........**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය 002600.3. භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන, "හෙරණගත්කරණ" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තූතිය

මෙම පොත සැකසීමට උපදෙස් ලබා දුන් අප විදුහලේ විදුහල්පතිතුමිය වන ශශිකලා සේනාධීර මහත්මියට,

අප හට විශාල ශක්තියක් වන ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමිය වන සුසිතා අල්විස් මහත්මියට,

නිරතුරු මා දිරිමත් කරමින් සෙනෙහස දෙන මාගේ පංතිභාර ගුරුමෑණියෙ වන නිලුෂිකා ගරුසිංහ මෙනවියට,

පොත සැකසීමට අඩිතාලම දමා දුන් සමන්මලී හෙට්ටිආරච්චි ගුරු මෑණියට සහ සෙනෙවිරත්න මහලේකම් ගුරු පියාණන්ට,

මගේ ආදරණීය අම්මා ට සහ තාත්තා ට,

උපකාර කළ සැමට,

ස්තූතියි ......

ඈත ගමක තිබුණු කඳක් උඩ ලස්සන ගෙයක් තිබුණා. ඒ ගෙදර කහ,තැඹිලි පාට ලොකු පූස් රාළ කෙනෙක් හිටියා.



දවසක් හිමිදිරි උදේ පූස් රාළ පුටුවක් උඩ සැප නින්දක හිටියා.
එයා ළඟ චීස් කෑල්ලක් තිබුණා.




පූස් රාළ ග්ර්... ග්ර්... හඬින් ගොරවන ශබ්දය ඇතට ඇහුණා.
ඒ වෙලාවේ ගුලක් ඇතුළේ හිටියා මී හාමි කෙනෙක් ඔළුව දාලා වටපිට බැලුවා.



වටපිට බලමින් කෑම සොයපු මී හාමි, පූස් රාළ ළඟ චීස් කෑල්ලක් තියෙනවා දැක්කා.



ගොඩක් සතුටු වුණු මී හාමි, චීස් කෑල්ල ගන්න නිදාගෙන හිටිය පූස් රාළ ළඟට හෙමින් හෙමින් කිට්ටු වුණා.



මී හාමි, චීස් කෑල්ල ගන්න අත දික් කරා. එතකොටම පූස් රාළට ඇහැරුණා. මී හාමි හොඳටම බය වුණා.




පූස් රාළට තරහා ගියා.
"ඇයි, මගේ චීස් කෑල්ල ගත්තේ?" පූස් රාළ තරහින් ඇහුවා.
තව තවත් බය වුණු මී හාමි වෙවුලන්න ගත්තා.



“මගේ පැටවු දවස් ගණනක් බඩගින්නේ...
ඒකයි මම චීස් කෑල්ල ගත්තේ....
මට සමාවෙන්න පූස් රාළ...” එහෙම කියන කොට මී හාමිගේ ඇස් වල කඳුළු පිරුණා.



මී හාමිගේ කතාව අහපු පූස් රාළට හරියට දුක හිතුණා.
ඊට පස්සේ පූස් රාළ, "මේ චීස් කෑල්ල පැටවුන්ට ගිහින් දෙන්න. මට කෑම ලැබුණාම එකෙන් කොටසක් මී හාමිට දෙන්නම්." කියා කිව්වා.



සතුටු වුණු මී හාමි චීස් කෑල්ල අරගෙන පූස් රාළට ස්තූති කරලා පැටවු ළඟට එක පිම්මේ දුවගෙන ගියා.



මගේ අම්මා වගේම හැම අම්මා කෙනෙක් ම දරුවන්ට ගොඩක් ආදරෙයි...
පූස් රාළ තනිවම හිතුවා.





නිමි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN : 978-624-208-311-7